අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය - 2022
-------------------------------------------------------

අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව 2021 සැප්තැම්බර් 08 දින එළැඹි ව්‍යාපෘති ඇගයීමේ ලේඛණයෙහි 55 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක වල ව්‍යාපෘති ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ආරක්ෂිත කාර්යක්ෂම සහ දේශගුණයට ඔරොත්තු දෙන සම්බන්ධතාවයන් සැපයීම සහ කෘෂිකාර්මික සැපයුම් දාම ශක්තිමත් කිරීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 101,499.6 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් මූල්‍යනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. 2023 අප්‍රේල් 19 දිනැති අංක RES 51645 ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවට අනුව, අවිනිශ්චිත සහ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සඳහා එ.ජ.ඩො. මිලියන 325 ක් නැවත වෙන්කිරීම හේතුවෙන් ණය මුදල රු. මිලියන 54,000.00 කට සමාන එ.ජ.ඩො. මිලියන 150 ක් දක්වා අඩු කරන ලදී. රු. මිලියන 300 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.83 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2026 ඔක්තෝම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්

ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. (මිලියන) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ අවිනිශ්චිත සහ හදිසි අවශ්‍යතා සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 325ක මුළු ප්‍රතිපාදනයෙන් වැය වූ වියදම 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි. තවද, අවිනිශ්චිත සහ හදිසි අවශ්‍යතා සංරචකය සහ ව්‍යාපෘතියේ අනෙකුත් සංරචක අතර බැදීම් ගාස්තු සහ පොලී බෙදා වෙන්කිරීම සඳහා පදනමක් හඳුනාගෙන නොතිබුණි. | **99,903.27** | අ.හ.ප්‍ර.සං. සඳහා වෙනම ආයතනයක් පිහිටුවා ඇති අතර අ.හ.ප්‍ර.සං ට අදාල වියදම් වෙනත් මූල්‍ය ප්‍රකාශණවල දක්වනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල අරමුදල් සැපයීමේ මාර්ග හෙළිදරව් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ණය ගිවිසුමේ 2.03 වගන්තියට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො.මිලියන 0.68 ක බැඳීම් ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 221.36 | ණය සම්බන්ධයෙන් වූ කැපවීම් ගාස්තු ණය ගිවිසුමේ සංරචකයක් ලෙස හඳුනාගෙන නොතිබුණි . | ණය ගිවිසුමේ කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පොලී අයකිරීම් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 254.06 | ණය සම්බන්ධයෙන් වූ පොලී ගාස්තු ණය ගිවිසුමේ සංරචකයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම පෙන්විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 5 හි 43(අ) වගන්තියට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් මූල්‍ය තත්වය ප්‍රකාශ කිරීමේ අවසාන දිනට විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා ඉහත අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම් ගිණුම්ගත කර නොතිබුණි. | 482.00 | ණය ලබාදෙන විදේශ විනිමය ඒකකය වාර්තා කරන විදේශ විනිමය ඒකකය නොවන අවස්ථාවලදී විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම අවශ්‍ය වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කල යුතුය. |

**2.2** රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමේ 11 උපලේඛනයේ B 2 සහ 4 වගන්ති | ණය ක්‍රියාත්මක වන දින සිට මාස තුනක් ඇතුළත ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතට අනුකූලව ව්‍යාපෘති ගැලපුම් අත්පොතක් (Matching Grant Manual) සකස් කළ යුතුය. කෙසේ වෙතත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම අත්පොත සකස් කිරීමට ව්‍යාපෘතිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සමාලෝචිත මුදල් වර්ෂය තුළ ගැලපුම් ප්‍රදාන සංරචකය ක්‍රියාත්මක කර නොමැත. | මෙහෙයුම් අත්පොතෙහි කොන්දේසි පිළිපැදිය යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 ඡේදය. | සමාලෝචිත වර්ෂය තුළ අවම වශයෙන් මාස දෙකකට වරක්වත් ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | ප්‍රමුඛතාවය සලකා බලා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වනු ලැබේ. | චක්‍රලේඛයට අනුගත විය යුතුය. |
| (ඇ) | 2016 ජුනි 10 දිනැති අංක. 02/2016 කළමණාකරණ විගණන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන යාන්ත්‍රණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කරනු ලැබේ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. |

3. භෞතික කාර්ය සාධනය

3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

(අ) ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය (%) | ලගාකරගත් කාර්යසාධනය (%) | | |
| ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | 24.94 | 11.83 | 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ඉලක්කගත සමස්ත භෞතික ප්‍රගතිය සියයට 21 ක් වූ අතර තත්‍ය ප්‍රගතිය සියයට 11 ක් විය. | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය සහ ඉන්ධන හා කොන්ත්‍රාත් ද්‍රව්‍ය හිඟය. |

| | |
|---|---|
| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | ක්ෂුද්‍ර ආර්ථික සාධකවල අහිතකර හැසිරීම මන්දගාමී ප්‍රගතියට ප්‍රධාන වශයෙන් හේතු වේ. |
| විගණකගේ නිර්දේශ | අපේක්ෂිත කාල රාමුව තුල ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

(i) ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීම - රත්නපුර දිස්ත්‍රික්කය

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය (%) | ලගාකරගත් කාර්යසාධනය (%) | | |
| ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | 64.42 | 20.21 | රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 22 ක මුළු දිග කි.මී. 76.62 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරන ලද අතර ව්‍යාපෘති ප්‍රසම්පාදන සැලැස්මට අනුව පැකේජ හතරක් යටතේ සියයට 49 සිට සියයට 98 දක්වා භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමට අපේක්ෂා | ඉන්ධන සහ කොන්ත්‍රාත් ද්‍රව්‍ය හිඟය. |

| | |
|---|---|
| | කරන ලදී. කෙසේ වුවද, මුළු මාර්ග දිගෙන් සියයට 9 ක් හෙවත් දිග කි.මී.7.1 ක් පමණක් රු. මිලියන 601.1 ක පිරිවැයකින් ප්‍රතිසංස්කරණය කර තිබුණි. එය 2022 දෙසැම්බර් 31 දිනට පැකේජ හතරේ භෞතික ප්‍රගතියෙන් සියයට 14 සිට සියයට 26 දක්වා පමණක් නියෝජනය විය. එබැවින් ව්‍යාපෘති කාල සීමාව තුළ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක. |
| කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | එම කාලය තුළ රටේ පැවති ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණවත් ඉන්ධන සහ පිපිරුම් ද්‍රව්‍ය ලබා ගැනීම දුෂ්කර විය. |
| විගණකගේ නිර්දේශ | අපේක්ෂිත කාල රාමුව තුල ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

**(ii)** ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීම - මාතලේ, අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්ක

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/විගණන ගැටලුව | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය (%) | කාර්යසාධනය (%) | | |
| ආරක්ෂිත සහ දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාව වැඩි දියුණු කිරීම | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | 22.39 | 15.31 | ව්‍යාපෘති ප්‍රසම්පාදන සැලැස්මට අනුව, ව්‍යාපෘතියේ කාලසීමාව තුළ මාතලේ, අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ග්‍රාමීය මාර්ග 63 ක මුළු දිග කි.මී. 281.83 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේවුවද, ග්‍රාමීය මාර්ග 54 ක සමුච්චිත දිග කි.මී. 251.67 ක් පමණක් ප්‍රතිසංස්කරණ කටයුතු | ඉන්ධන සීමා කිරීම් සහ හිකොන්ත්‍රාත් ද්‍රව්‍ය හය රට තුළ පැවතිණි. |

2022 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර තිබුණු අතර එය සියයට 1 සිට සියයට 21 දක්වා වූ අඩු භෞතික ප්‍රගතියක් නියෝජනය කළේය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී සම්පූර්ණ මාර්ග දිගෙන් සියයට 1.7 ක් වූ කි.මී. 4.5 ක් පමණක් නිම කර ඇති බව නිරීක්ෂණය විය.

| | |
|---|---|
| කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | මෙම කොන්ත්‍රාත් පැකේජවල සත්‍ය සහ සැලසුම්ගත භෞතික ප්‍රගතිය අතර අහිතකර විචලනය සඳහා සාර්ව ආර්ථික සාධකවල අහිතකර බලපෑම ප්‍රධාන වශයෙන් බලපා ඇත. |
| විගණකගේ නිර්දේශ | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය, පැල්මඩුල්ල සහ රත්නපුර ග්‍රාමීය මාර්ග කි.මී. 76.62 ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ උපදේශන සේවාව රු. මිලියන 164.84 ක පිරිවැටකට උපදේශන ආයතනයකට ප්‍රදානය කර තිබුණි. උපදේශන සේවාවේ පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 80.5 ක් වූ අතර එය ඉංජිනේරු ඇස්තමේන්තුවේ පිරිවැය සියයට 104 කින් ඉක්මවා ගොස් තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කමිටුව එම විචලනය විශ්ලේෂණය කර නොතිබුණි. එය විගණනයේදී ගැටලු සහගත තත්ත්වයක් විය. | අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව ඉහළ විචලනය විශ්ලේෂණය කළ අතර දෙවරක් සාකච්ඡා කර ඔවුන්ගේ පිරිවැය යෝජනාව මූලික ඉදිරිපත් කිරීමෙන් සියයට 36 කින් අඩු කර ඇත. | පිරිවැය ඇස්තමේන්තුව විශ්ලේෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | උපදේශන සේවාව තෝරා ගැනීම සඳහා සුදුසුකම් මත පදනම් වූ ප්‍රසම්පාදන ක්‍රමවේදයේ උපරිම සීමාව එ.ජ.ඩො.මිලියන 0.3 ක් වුවද, මෙම ප්‍රසම්පාදනයේදී මෙම සීමාව එ.ජ.ඩො.මිලියන 0.2 කින් ඉක්මවා ගොස් ඇති බව නිරීක්ෂණය වූ අතර එම තේරීම් ක්‍රමය භාවිත කිරීමට හේතුව විගණනයට අනාවරණය වී නොතිබුණි. | එම සීමාව එ.ජ.ඩො මිලියන 0.2 ඉක්මවා ඇත. කෙසේ වෙතත්, සාකච්ඡා කරන ලද පිරිවැය යෝජනාව බැංකුවේ සමාලෝචනයට ඉදිරිපත් කළ අතර එකඟතාවය ලබාගෙන ඇත. | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇති කොන්දේසි පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හම්බන්තොට, මොණරාගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල ග්‍රාමීය මාර්ග කි.මී. **200** ක පාරිසරික හා සමාජීය පරීක්ෂාව සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තුව රු. මිලියන **19.66** කට පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන **3.5** ක් හෝ සියයට **21** කින් ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා තිබුණි. | උපදේශක රටේ සියලු දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ඔහුගේ වියදම් යෝජනාව ඉදිරිපත් කර ඇත. | අමතර වියදම් වළක්වා ගැනීම සඳහා නිවැරදි ඇස්තමේන්තුවක් සකස්කළ යුතුය. |

**3.3.** ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සමස්ත ප්‍රතිපාදන වූ රු.මිලියන **54,000** කට සමාන එ.ජ.ඩො.මිලියන **150** කින් **2022** දෙසැම්බර් **31** දිනට ව්‍යාපෘතිය විසින් රු. මිලියන **2,241.94** ක් පමණක් උපයෝජනය කර තිබුණි. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත් වල දුර්වල ප්‍රගතිය ව්‍යාපෘතියේ අරමුදල් ඌන උපයෝජනය සඳහා මූලික වශයෙන් බලපා තිබුණි. | පසුගාමී මූල්‍යනය යටතේ රු.මිලියන **2712.12** ක් උපයෝජනය කර තිබුණු අතර මාර්ගෝපදේශය අනුව වැය විෂයට හර කර නොතිබුණි. | ණය අරමුදල ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) | අවිනිශ්චිත හා හදිසි අවශ්‍යතා සංරචකය **(CERC)** සක්‍රිය කිරීමෙන් පසුව ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දක්වා ඇති මූල්‍ය ඉලක්ක සංශෝධනය කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේදී ඉලක්ක ගත අරමුදල් නිදහස් කිරීම සමඟ අරමුදල් උපයෝජනය සැසඳීමට නොහැකි විය. කෙසේ වුවද, ව්‍යාපෘතිය මගින් **2022** දෙසැම්බර් **31** දිනට රු. මිලියන **221.36** ක කැපකිරීම් ගාස්තුවක් ණය නියෝජිතායතනයට ගෙවා තිබුණි. | ණය සංරචකයන්ගේ අවසන් එකඟතාවයක් නොමැති බැවින් සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සංශෝධිත වියපැහැදම් සැලැස්ම සකස් කර නොතිබුණි. | නව වෙනස්කම් අනුව ඉලක්ක සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වැය විෂයය අංක **117-2-4-48-2506-0-17** යටතේ ශ්‍රී ලංකා රජය විසින් වෙන් කරන ලද රු. මිලියන **70** න් රු. මිලියන **47.83** ක් පමණක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය තුල වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට **68.33** ක් නියෝජනය කර තිබුණි. | විගණන නිරීක්ෂණ අන්තර්ගතය නිවැරදිය. | රජයේ ප්‍රතිපාදන ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4** පරිභාහිර ගෙවීම්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ක්‍රියාත්මක ගිවිසුම සහ ආධාරක සැලැස්මේ **22** සහ **33** දරන වගන්ති අනුව, ණය ගිවිසුම් දින සිට මාස **12** ක කාලය තුළ කි.මී. **100,000** ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ දැනටමත් සිදු කර ඇති සුදුසුකම් ලබන එ.ජ.ඩො. මිලියන **75** ක් දක්වා වූ වියදම් ප්‍රතිපූරණය කිරීමට ලෝක බැංකු නියෝජිත පිරිස එකඟ වී තිබුණි. කෙසේ | **100,000 Km** වැඩසටහන මගින් පසුගාමී මූල්‍යනය කාලපරිච්ඡේදය තුළ ගෙවන ලද වියදම් මෙම සංරචකය යටතේ පරීක්ෂා කර අයකර ගන්නා ලදී. | නියමිත අවශ්‍යතා අනුව ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වුවද, ලෝක බැංකු අවශ්‍යතා පිළිපැදීමට නොහැකි වීම හේතුවෙන් එ.ජ.ඩො. මිලියන **10.89** ට සමාන රු. මිලියන **3,949.43** ක් පමණක් ප්‍රතිපූරණය කර තිබුණි. මේ අනුව පසුගාමී මූල්‍යකරණය යටතේ මුළු ප්‍රතිපාදනවලින් සියයට **14.52** ක් පමණක් උපයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ව්‍යාපෘති අරමුණුවලට සෘජුව අදාල නොවන පසුගාමී මූල්‍යන ප්‍රතිපූර්ණ කිරීම් රු. මිලියන **3,949.43** ක් කෙරීගෙන යන වැඩ ලෙස සටහන් කර තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය අදාල වියදම් කෙරීගෙන යන වැඩ ලෙස වාර්තා කර ඇත. | නිවැරදි ව්‍යාපෘති පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ පෙන්විය යුතුය. |

**3.5** මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය යටතේ හදිසි ප්‍රතිචාර සංරචකය **(CERC)** සක්‍රීය කිරීම<br>භාණ්ඩාගාර ලේකම්වරයාගේ **2022** මැයි **09** දිනැති ලිපියට සහ ඒ සඳහා ලෝක බැංකුවේ නේවාසික අධ්‍යක්ෂවරයා විසින් **2022** අගෝස්තු **18** දින යවන ලද ලිපියට අනුව, ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන **325** ක මුදලක් වෙන් කර තිබුණි. ක්ෂණික හා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ සමාජ ආරක්ෂණය නැවත ලබාදීම මගින් සමාජීය ස්ථාවරත්වය ප්‍රතිස්ථාපනය කිරීමට සහ ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීමට හදිසි ප්‍රතිචාර සංරචකයේ අරමුදල් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (අ) | ව්‍යාපෘතියේ අනුමත මූලික විෂය පථයේ වෙනස්කම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ප්‍රථිව්‍යුහගතකරණයට අදාල පත්‍රයක් වෙනම යවා ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො.මිලියන **450** ක් වූ ආරක්ෂිත සහ දේශගුණික ඔරොත්තු දෙන ප්‍රවාහන සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සහ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො.මිලියන **50** ක් වූ ගොවීන් සඳහා සැපයුම් දාමය වැඩි දියුණු කිරීමේ සේවා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම නමින් සංරචන **2** යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර සංරචකය සක්‍රිය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ මූලික අංග වෙනස් කිරීම කළ යුතු වේ. කෙසේ වෙතත්, **2023** අප්‍රේල් දක්වා මුල් ක්‍රියාකාරකම්වල විෂය පථය වෙනස් කිරීම නිසි ලෙස | භාණ්ඩාගාර ලේකම්ගේ ඉල්ලීම මත හදිසි ප්‍රතිචාර සංරචකය සක්‍රීය කිරීමත් සමඟ ව්‍යාපෘති විෂය පථය වෙනස් කර ඇති අතර ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකා **2023/04/19** දින අනුමත කර ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතියේ විෂයපථ යථාර්ථවාදී පදනමකින් තොරව වෙනස් කර ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ව්‍යාපෘතියේ අවිනිශ්චිත සහ හදිසි අවශ්‍යතා සංරචන (CERC) සක්‍රිය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ 1 වන සංරචකය සඳහා මූලික ණය ප්‍රතිපාදන එ.ජ.ඩො. මිලියන 450 ක සිට එ.ජ.ඩො. මිලියන 150 ක් දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ 2 වන සංරචකය සඳහා අරමුදල් වෙන් කිරීම 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | සංරචක 2 පුළුල් ලෙස සාකච්ඡා කෙරෙන අතර ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල පත්‍රිකාවට ඇතුළත් කරනු ඇත. | ව්‍යාපෘති සංරචකය අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ විෂය පථය සීමා කිරීමෙන් පසුව, ණය ගිවිසුම, ව්‍යාපෘති සංවර්ධන අරමුණු, ව්‍යාපෘති ප්‍රතිඵල රාමුව, ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන, මුදල් වියපැහැදම් ඉලක්ක සහ කොන්දේසි, පාරිසරික සහ සමාජ රාමුව ඒ අනුව වෙනස් විය යුතුය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ඇගයුම් ලේඛනය ඒ අනුව සංශෝධනය කර නොතිබුණි. එය අනාගතයේ ව්‍යාපෘති ප්‍රගතියට අහිතකර ලෙස බලපෑ හැකිය. | අරමුදල් නියෝජිතායතනයේ සහයෝගීතාවයෙන් ව්‍යාපෘති ඇගයුම් ලේඛනය සංශෝධනය සිදු කල යුතු වේ. | සංශෝධනයට අනුව ව්‍යාපෘති ඇගයුම් ලේඛනය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණයට අදාල නිරීක්ෂණ

| සේවා ඝණය | තනතුරු ගණන | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අනුමත | 2022 දෙසැම්බර් 31 වන දිනට තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| ජ්‍යෝෂ්ඨ ඉංජිනේරු | 5 | 3 | 2 | ව්‍යාපෘති ජීවන චක්‍රයට අනුකූලව ව්‍යාපෘතිය ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් පවත්වා ගෙන ඇත. | ව්‍යාපෘති කාර්ය සාධනය උපරිම කිරීම සඳහා ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගත යුතුය. |
| ජ්‍යෝෂ්ඨ ප්‍රසම්පාදන විශේෂඥ | 1 | - | 1 | | |
| ප්‍රසම්පාදන ඉංජිනේරු | 2 | - | 2 | | |
| පරිසර විශේෂඥ | 1 | - | 1 | | |
| සමාජ ආරක්ෂණ විශේෂඥ | 1 | - | 1 | | |